මගේ අංකය :- SP-PSC/32/LI/31/02
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සංකීර්ණය,
කළුවැල්ල, ගාල්ල.
2025.10. 01

ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත.
කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, දකුණු පළාත.

## දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයට (PL-02) අයත් උපස්ථායක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

## Limited Competitive Examination for Recruitment to the Post of Attendant Grade III under Primary Grade Semi Skilled Service Category (PL-02) of the Department of Ayurveda, Southern Province - 2025

1.0 අංක 288 හා 2018.11.07 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණය (PL 02-2006-A) සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත් ව දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින **උපස්ථායක (පිරිමි)** තනතුරට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශ්‍රේණිවල සේවයේ නියුතු වූවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2025 ඔක්තෝබර් මස 22** දින වන අතර, මෙම විභාගය 2025 නොවැම්බර්/ දෙසැම්බර් මස ගාල්ල නගරයේ දී පැවැත්වේ.

2.0 (අ) සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 07 කි.

**(ආ) බඳවා ගැනීමේ ක්‍රමවේදය** :- ලිඛිත පරීක්ෂණයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඔවුන් ලිඛිත පරීක්ෂණයේ දී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 **වැටුප** :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි PL 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. 41,800-10×490-10×540-10×590-12×630-රු. 65,560/-ක් වන අතර එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. එසේ වුව ද, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

**6.0 බඳවා ගැනීමේ සුදුසුකම් :-** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**6.1 අධ්‍යාපන සුදුසුකම් :-** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් හයකට (06) නොඅඩුව සම්මාන දෙකක් (02) සහිතව සමත් වී තිබිය යුතු ය.

**සටහන -** මෙම බඳවා ගැනීම් පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින වන විට දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ PL-1 හා PL-2 වැටුප් කේත අංක හිමි ස්ථිර තනතුරක සේවය කරන සේවකයින් සඳහා පමණක් අධ්‍යාපන සුදුසුකම් ලෙස රජයේ පිළිගත් පාසලක 8 ශ්‍රේණිය සමත් වීම ප්‍රමාණවත් වේ.

තෝරාගත් උපස්ථායකයන් සඳහා තුන් මසක පුහුණුවක් ලබා දෙනු ලැබේ. පුහුණු කාලය තුළ විභාගවලින් අසමත් වන්නා වූ හෝ පුහුණු ආයතනයේ විනය, නිවාඩු පිළිබඳ නීති නොපිළිපදින්නා වූ හෝ සේවකයන් ඔවුන් මුලින් දැරූ තනතුරුවලට ආපසු යවනු ලැබේ.

**6.2 වෘත්තීය සුදුසුකම් :-** අදාළ නොවේ.

**6.3 පළපුරුද්ද :-** දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 05 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා සේවයේ ස්ථිර කර ඇති සේවකයන් විය යුතු ය.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 6/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**6.4 වයස :-** අදාළ නොවේ.

**7.0 විභාග පටිපාටිය :-**

මෙම විභාගය එක් ප්‍රශ්න පත්‍රයකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| **විෂයය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම | පැය 01 ½ | 100 | 40 |

ඉහත විෂයයට අදාළ විෂයය නිර්දේශය පහත පරිදි වේ.

- **<u>බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම</u>**

  සෞඛ්‍ය හා ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ කරුණු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ.

**8.0 විභාග ප්‍රතිඵල :-**

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත තැපැල් මඟින් හා සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව බාගත කරගත හැකි පරිදි මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

**9.0 විභාග ගාස්තු :-**

විභාග ගාස්තුව රු. 1,000/- කි. මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ. සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA හෝ MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිදු ආකාරයකින් පිළිගනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තුව අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැළකිය යුතු ය.

**සටහන** - අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

**10.0 අයදුම්කළ යුතු පිළිවෙල :-**

සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු කළ යුතු ය. ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා අදාළ තොරතුරු පරීක්ෂාකර මාර්ගගතව නිර්දේශය ලබා දීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2025 ඔක්තෝබර් 22 වන දින ප.ව. 6.00** න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

**10.1** අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම් පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතක් එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව සම්පූර්ණ නොකළ යුතු ය.

**10.2** අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

**10.3** වෙනත් ක්‍රම මඟින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම්වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

**10.4** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව යොමු (Submit) කරන ලද අයදුම්පත බාගත (Download) කර එහි දෘඩ පිටපත (Hard Copy) නිර්දේශ කර මෙම කොමිෂන් සභාව වෙත එවීම සඳහා අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු වන ආයතනයේ ප්‍රධානියාට භාරදිය යුතු ය.

**11.0 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-**

විභාගය සඳහා අයදුම් කිරීමේ කාලය අවසන් වීමෙන් පසු දින 02ක කාලයක් තුළ එනම්, **2025 ඔක්තෝබර් 24 වන දින ප.ව. 06.00 දක්වා** අයදුම්පත් මාර්ගගතව නිර්දේශ කිරීමේ අවස්ථාව පවතී. ඒ සඳහා අදාළ ආයතනය විසින් නම් කළ මාණ්ඩලික නිලධාරියා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති විභාග අයදුම්පත් නිර්දේශ කිරීමේ කවුළුවට පිවිස (Main menu > Exams > Coordinator Login) අදාළ විභාගය තෝරා තම ආයතනය යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂාකර බලා නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

**11.1** අයදුම්කරුවන් විසින් සපයා ඇති සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරු ව අයදුම්පත් නිර්දේශ කළ යුතු අතර, යම් හෙයකින් සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබිය දී අයදුම්පත් නිර්දේශ කර ඇත්නම් ඒ පිළිබඳ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා

විසින් දැරිය යුතු වේ. අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වන අතර, නිර්දේශ නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලෙසකිනුදු නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

11.2 නිර්දේශ කිරීමේ කාලසීමාව අවසන් වූ පසු ස්වයංක්‍රීයව එම කවුළුව ක්‍රියා විරහිත වන අතර, නිර්දේශ නොකරන ලද අයදුම්පත් සියල්ල දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

11.3 සියලු අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු, නිර්දේශිත අයදුම්පත් ලේඛනය එම ස්ථානයෙන් ම බාගත කර ගත හැකි අතර, එය මුද්‍රණය කර මෙම කොමිෂන් සභාව වෙත තැපැල් මඟින් එවීමට කටයුතු කළ යුතු ය.

11.4 එම ලේඛනය සමඟ එම ආයතනය යටතේ අයදුම් කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල දෘඪ පිටපත් ද නිර්දේශ කර එකවර මෙම කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, එම ලේඛන බහා එවන කවරයේ වම් පස " **දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයට (PL-02) අයත් උපස්ථායක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025** " යන්න සඳහන් කළ යුතු ය.

## 12.0 ප්‍රවේශ පත්‍ර :-

නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම සීමිත තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඔබ ආයතනයේ සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා වෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර, වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකි ය.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය වියයුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර, ආයතනයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු මඟින් අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 13.0 විභාගයට ඇතුළත් කර ගැනීම :-

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතු ය.

## 14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**15.0** මාර්ගගතව අයදුම්පත් කැඳවන බැවින්, සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව ආයතන ප්‍රධානියා විසින් අයදුම්පත්‍රය නිර්දේශ කර ඇති සෑම අයදුම්කරුවෙකුට ම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබයි.

**16.0** **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. තව ද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

**17.0** විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**18.0** විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට ආනුෂංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සී.පී. රාජකරුණා**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

(**සැළකිය යුතුයි** - ඔබ ආයතනයට අනුබද්ධ ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු මෙම සීමිත තරග විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් කරුණාකර ඔවුන් දැනුම්වත් කිරීමට කටයුතු කරන්න.)